# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1850/54 - 2014 පෙබරවාරි මස 21 වැනි සිකුරාදා - 2014.02.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1973 අංක 25 දරන ක්‍රීඩා පනත

32, 33 සහ 34 වගන්ති යටතේ නියෝග

ක්‍රීඩා අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ වන මම, 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32, 33 සහ 34 වන වගන්ති යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර, කරාතේ ක්‍රීඩාව සඳහා ජාතික සංගමය වන ශ්‍රී ලංකා කරාතේ දෝ සම්මේලනයේ කටයුතු නිළවරණයක් පවත්වන තෙක් හෝ නැවත දැනුම් දෙන තුරු පවත්වාගෙන යාම සඳහා තාවකාලික වැඩපිළිවෙලක් වශයෙන්, දැනට සිටින නිලධාරී මණ්ඩලය 2014.02.28 වැනි දින සිට අවලංගු කරන අතර, ශ්‍රී ලංකා කරාතේ දෝ සම්මේලනයේ කටයුතු නිළවරණයක් පවත්වන තෙක් හෝ නැවත දැනුම් දෙන තුරු පවත්වාගෙන යාම සඳහා තාවකාලික වැඩපිළිවෙලක් වශයෙන් 2014.03.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කළ තැනැත්තන්ගේ නම් පහත පරිදි බැව් මෙයින් දන්වා සිටිමි.

| | | |
|---|---|---|
| එච්. එම්. ගාමිණී විජය බණ්ඩාර මහතා | - | සභාපති |
| අනුර ඒ. කත්‍රිආරච්චි මහතා | - | ලේකම් |
| ගයාන් සමින්ද මහතා | - | භාණ්ඩාගාරික |
| කේ. රාමචන්ද්‍රන් මහතා | - | සාමාජික |
| ක්ලෙමන්ට් ද සොයිසා මහතා | - | සාමාජික |

මහින්දානන්ද අලුත්ගමගේ,
ක්‍රීඩා අමාත්‍ය.

2014 පෙබරවාරි මස 20 වැනි දින,
කොළඹ දී ය.

03 - 224


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - G 19106 — 70 (2014/02)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*